# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය: ...............................................

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | 1 පත්‍රය | කාලය පැය 01 |

**සැලකිය යුතුයි.**

i. සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ උත්තරය තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා ද පිළිපදින්න.

v. අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි කද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. අධ්‍යාපනයේ **<u>කටුකොහොල් හැරවීම</u>** ගැන එතුමිය සිය කතාවේදී දැඩිව අවධාරණය කළාය .

   (1) පනතක් සම්මත කිරීම. (2) බාධක ඉවත් කිරීම.

   (3) කටුකොහොල් ඉවත් කිරිම. (4) සහන ලබා දීම.

2. මෙතෙක් ඔහු කළ පාපකර්ම **මර ඇඳේ දී** මතකය ට නැගෙනු ඇතැයි සැමගේ විශ්වාසය යි.

   (1) සයනයේ දී (2) ස්ථිරයෙන් ම

   (3) මරණය සිදු වීමෙන් (4) අන්තිම අවස්ථාවේ

3. වැටුප් පිළිබඳ ගැටලුවේ දී හෙදියෝ **කඹ අදින්නට** සිදුවීම නිසා රෝගීන් අසරණ විය.

   (1) එකඟතාවක් නැතිවීම (2) ස්ථිරතාවයෙන්

   (3) අකමැත්ත ප්‍රකාශ වීම (4) එකඟවීම

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න

4. කාව්‍ය නිර්මාණකරණය මෙන් ම විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධය ......................යි

   (1) ප්‍රතිභාවය (2) පරිකල්පනය (3) සතතාභ්‍යාසය (4) ව්‍යුත්පත්තිය

5. ගෝලීයකරණයත් සමග ඇති වී තිබෙන නව ..................... හමුවේ සන්නිවේදන කාර්ය පහසු කිරීමෙහිලා තාක්ෂණික මෙවලම් මහෝපකාරී වෙයි.

   (1) අදහස් (2) විපර්යාස (3) ආකර්ෂණය (4) විපරීතයන්

6. ලෝකයේ ඇති ඉතා ම ශාන්ත වූ ..................... සමාධි පිළිමය හැටියට ජගත් කීර්තියක් උසුලන කලා කෘතියකි.

(1) ශෛලමය (2) දාරුමය (3) රිදීමය (4) රන්මය

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඓරාවණ , මූල්‍ය . අවස්ථෝචිත , සාමර්ථ්‍යය
(2) ව්‍යුහය , විද්‍යාමාන , ශ්‍රේෂ්ඨ , විශිෂ්ට
(3) ගෘහස්ථ , ඓක්‍යය , සමස්ත , ප්‍රත්‍යයාර්ථ
(4) නිෂ්ඵල . ශිෂ්ඨාචාරය , ව්‍යාංග්‍යාර්ථ , ධූරය

8. මාලිගය , කෘදන්ත . කුඩය , රුවනාර
මෙම පදවල මුල් අක්ෂරයේ අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කෙටි ඉස්පිල්ල , ගැටපිල්ල , පාපිල්ල , කෙටි පාපිල්ල
(2) ඉස්පිල්ල , ගැටපිල්ල , කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල
(3) ඇලපිල්ල , ගැටපිල්ල , දීර්ඝ පාපිල්ල , කෙටි පාපිල්ල
(4) ඇලපිල්ල , ගැටපිල්ල , පාපිල්ල , ඇදපිල්ල

9. " **ජපානය** " යන පදයේ අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ ,
(1) මූර්ධජ , තාලුජ , දන්තජ (2) ඕෂ්ඨජ , දන්තජ , මූර්ධජ
(3) තාලුජ , කණ්ඨජ , මූර්ධජ (4) තාලුජ , ඕෂ්ඨජ , දන්තජ

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) හලාවත , පුත්තලම , අම්පාර, යාපනය
(2) ඕලන්දය , ගානාව , මැඩගස්කරය , රුසියාව
(3) තුරුණු , තේරුණු , තෝරන , තාරුණ්‍ය
(4) අලංකාර , අලාභය , අල්තාරය , අල්මාරිය

11. අනුක්ත නාම පද දෙකක් හා උක්ත පද දෙකක් පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) රිතීන් , නිළියක , අයෙක් , කෙනෙක්
(2) ගිරවු , සියොතුන් , ගවයන් , සිවුපාවුන්
(3) ගුරුවරයෙක් , නීතිඥයන් , හෙදියක් , කම්කරුවෙක්
(4) උපාසිකාවක , උපාසකයෙකු , බිරිඳක , සිඟන්නියක

12. " ජනාධිපතිතුමා 'අමාත්‍යවරුන්ට' පොදු විනය නීති මාලාවක් පැන වූයේ ය."
මෙම වැකියේ **අමාත්‍යවරුන්ට** යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) කරණ (2) කර්ම (3) සම්ප්‍රදාන (4) ආධාර

13. "අනෞචිත්‍ය" යන්න අයත් වන්නේ ,
(1) අව්‍ය සමාසයට ය. (2) විශේෂණ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

14. " ප්‍රසංග + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍ය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රාසංගීක (2) ප්‍රාසාංගික (3) ප්‍රසාංගික (4) ප්‍රාසංගික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.
(1) නිපාත → මෙන් , සේ ,එව් ,බඳු
(2) කෘදන්ත → බැලීම් ,නැටිලි , සඳවත ,ලියන්නා
(3) උපසර්ග → පිළිමල් ,දුබල ,කුකවි , නිර්මල
(4) අසම්භාව්‍ය ක්‍රියා → කියත ,කියද්දී , කීවොත් , කියන විට

16. පූර්ව ක්‍රියාවක් යෙදී නැති වාක්‍ය කුමක් ද?
(1) මල්ලි දිය කඩිත්තෙන් පැන ගියේ ය.
(2) කියත උන් මෙතෙපල - ආයේ ය ඇදුරු ගුත්තිල
(3) කතිකාචාර්යතුමා දේශනය පවත්වා අභ්‍යාස ලබා දුන්නේ ය.
(4) සිරිමෙවන් එවරස්ට් කන්ද තරණය කර වාර්තාවක් පිහිටුවේ ය.

17. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) පද්‍ය කාව්‍ය , නවකතාව , කෙටිකථාව , සොකරි
(2) පැන , පැන්සල , අඩිකෝදුව , මකනය
(3) ඇතිලිය , මුට්ටිය , අඩිවළඳ , නෑඹිලිය
(4) මාලය , මුදුව , කරාබුව , වළල්ල

- අංක 18 -20 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න

18. **මහින්දාගමනය** ලංකා බෞද්ධ ඉතිහාසයේ වැදගත් ම සිදුවීමකි.
(1) මිහිඳු හිමිගේ පැමිණීම
(2) හේමමාලා කුමරියගේ පැමිණීම
(3) සංඝමිත්තා මෙහෙණියගේ පැමිණීම
(4) දන්ත කුමරුගේ පැමිණීම

19. **"ත"** අක්ෂරය යනු දන්තෝෂ්ඨජ අක්ෂරයකි.
(1) තොල්වලින් හට ගන්නා
(2) දත් හා තොල්වලින් හට ගන්නා
(3) උගුරින් හා දත්වලින් හට ගන්නා
(4) දත්වලින් හට ගන්නා

20. **සින්ධූපමාන** වැව් තලා මතින් ඇදී පද්ම රේණුයෙන් සුගන්ධ වී
(1) සින්දු දේශය හා සමාන
(2) කිරි සයුර හා සමාන
(3) සීදී ගිය වැව් හා සමාන
(4) සාගරය හා සමාන

21. එක් එක් පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න

| | | | | |
|---|---|---|---|---|
| (1) | ගින්දර - අග්නි | අඹ - උදක | තාරපති - චන්ද්‍රයා | රුහිරු -රුධිරය |
| (2) | සුමට - සුමුදු | සතුරු - පිළිමල් | පවර - ප්‍රාකාර | අටවි - වනය |
| (3) | පවන - සුළඟ | ජනක - පියා | හංසයා - හස | සිඳු - ගංගාව |
| (4) | වෘක්ෂ - තුරු | ග්‍රන්ථය - පුස්තකය | ආපත්ති - විපත්ති | පියස - වහල |

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
1) පාඨශාලාව → විදුහල , පාසල , සිප්හල , ගුරු ගෙදර
2) අහස → නුබ , අම්බර , සුරමග , ගගන
3) පද්මය → කමල , සිහපත , පංකජ , අරවින්ද
4) පණ්ඩිත → උගත් , වියත්, විශාරද , අග්‍ර

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) රිසි - පූර්ණ
(2) දුර්ලභ - සුලභ
(3) ස්වාධීන - පරාධීන
(4) විද්‍යාත්මක - අවිද්‍යාත්මක

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න

(1) සැකයක්, වාර්තා කිරීමක්, ආරංචියක් වැනි අදහසක් මතු කරන වාක්‍ය සංශ්‍යාර්ථ වාක්‍ය ලෙස හඳුන්වයි.
(2) යංශය සහිත අක්ෂර එන්නේ , අකාරාදී පිළිවෙළෙහි "ව" යන්නට පසුව ය.
(3) අර්ධානුනාසික්‍ය අක්ෂර ලෙස හැඳින්වනුයේ සඤ්ඤක අක්ෂරවලට ම ය.
(4) ප්‍රශ්නවාචී යෙදුමකින් අවසන් වන වාක්‍යවල කර්තෘ අනුක්ත වෙයි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(1) කණ්ඩායමකට සන්නිවේදනය කර ගත හැකි ශබ්ද හා අර්ථ සම්මුතියක් අපි භාෂාවක් ලෙස හඳුන්වනවා.
(2) කුඩා කල සිටම ප්‍රශ්න කිරීමට හා විමසීමට තිබූ රුචිය ඔහු ගේ බුද්ධි ප්‍රබෝධයේ පදනම විය.
(3) එවිට කම්කරුවෝ කඩිසර ලෙස ඉන් ඉවතට පැන කසළ හලති.
(4) හේන් ගොවිතැනේදී අත්තම් ක්‍රමය කෙරෙහි ගොවීහු සැලකිල්ලක් දැක් වූහ.

- අංක 26 - 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. " ජන්මයෙන් ආ දුර්ගුණ ඉවතලිය නොහැකි බව" ප්‍රකාශ වන්නේ,

(1) කලකදි වහලු කලක දි රස වෙනවාලු
(2) අතු කඩා මොර කන්නා සේ
(3) උපන් ගෙයි සිරිත බලි ඇරියත් යන්නේ නැතිලු
(4) එපා වාහෙට හොදි බෙදන්නා වගේ

27. "ස්ථිර තීරණයක් නැති බව" ප්‍රකාශ වන්නේ,

(1) අබරා සිල් ගන්නා වගේ (2) කලුවා මාරපන් ගියා වගේ
(3) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ (4) ඔංචිල්ලාව එහාට ගියත් මෙහාට එනවාලු

28. "මහේසිකා" "සන්නිවේදනය" යන සන්ධි පද අයත් සන්ධි වර්ග නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) ස්වරාදේශ සන්ධිය - ගාත්‍රාදේශ සන්ධිය (2) ස්වරාදේශ සන්ධිය - ද්විත්ව රූප සන්ධිය
(3) ගාත්‍රාදේශ සන්ධිය - පරරූප සන්ධිය (4) පූර්වරූප සන්ධිය - පරරූප සන්ධිය

- අංක 29 -30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

29. (1) වෛද්‍යවරු විසින් රෝගීන් සුවපත් කෙරෙති.
(2) සිසුන් ශිල්ප ඉගෙන ගත යුතු ය.
(3) මම බත් කද්දී තාත්තා විහිළු කළේ ය.
(4) අපි සැවොම පියෙක් බඳු ගුරු භවතා අගය කළෙමු.

30. (1) ළමයි උදෑසනින් ම පාසලට පැමිණ නැත.

(2) එක් අයෙක් කනස්සල්ල පළ කරති

(3) චණ්ඩාශෝක රජතුමා දරුණු පාලකයෙකු වූ

(4) වෛද්‍යවරුන් වර්ජනයේ යෙදෙති' යි රෝගීහු සිතති.

31.

- ඉන්දියානු ජනයා මේ දිවයිනට සංක්‍රමණය වීමට පෙර ............. මෙරට පැවතියේ හේන් ගොවිතැන ය.
- උපාසකම්මා ............. කෙටිකතාව ලියන්න මාගේ කල්පනාව පුබුදන ලද්දේ පාසලේ අත්දැකීමකි.
- පාට සරුංගල් .............. අපේ ජීවිතේ
- දුටු සත සිතට තුටු වන .............ට නිතියෙන

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) සිට , නමැති , වාගේ , ලෙස (2) ලෙස , වාගේ , සිට , නැමැති

3) වාගේ , ලෙස , සිට , නැමති (4) නමැති , වාගේ , සිට ලෙස

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

' මෙතන පාසල් යන වයසේ දරුවොත් හුඟක් ඉන්නවා'

(1) මෙතන පාසල් වයසේ දරුවෝ සිටිති.

(2) මෙහේ පාසල් දරුවෝ බොහෝ සිටියි.

(3) මෙහි පාසල් දරුවෝ බොහෝ සිටිති.

(4) මෙහි පාසල් දරුවන් සිටිති.

33. "සුදු කොඩි " කෙටිකථා සංග්‍රහයේ කතුවරයා වන්නේ,

(1) මහින්ද ප්‍රසාද් මස්ඉඹුල (2) ඩබ්.ඒ. ද. සිල්වා

(3) ඒ. වී. සුරවීර (4) ඇරැව්වල නන්දිමිත්‍ර

34. කුඹුයොන් සයුරු බොන එහි මිණි සේ අනත
නුඹ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
සැඳෑ සඳුට සදමින් මග නිසා කත
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත

ඉහත පද්‍ය නිර්මාණය ඇතුළත් වන්නේ

(1) හංස සන්දේශයේ ය. 2) පරෙවි සන්දේශයේ ය.

3) මයුර සන්දේශයේ ය. 4) සැළලිහිණි සන්දේශයේ ය.

35. "පෙර කිසි කලෙක නුදුටු තරම් මහත් ගණනක් කුරුල්ලන්ගෙන් මෙදින උයන අලංකාරවත් විය"
මෙම කොටස උපුටා ගත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ

1) ඩබ්. ඒ. ද. සිල්වා 2) මාර්ටින් වික්‍රමසිංහ

3) එස්. මහින්ද හිමි 4) පරාක්‍රම කොඩිතුවක්කු

36. වෙරළ ඉඟිළ තුළ රළ වැළ ලෙස　　උළෙල
කැබලි සපළ පෙළ ලෙළවමින් කෙළ　　කෙළ

මෙම පද පෙළෙන් මතුවන කාව්‍යාලංකාරය කුමක් ද ?
1) ව්‍යාංගාර්ථය　2) රූපකාලංකාරය　3) උපමාලංකාරය　4) අනුප්‍රාසය

37. දිගාමඬුලු උප භාෂාවේ යෙදෙන **පරියා** යනු
1) වලසා　2) බල්ලා　3) මී හරකා　4) හොද්ද

38. ඔපනැලි යටින් පෙති ගෝමර ඉහෙන　　නගේ
ඇඳි සේලේ රැලි සුළඟට නටන　　නගේ
බුලත් හපා හප සුළඟට පිඹින　　නගේ
------------------------------------------------------------

ඉහත පද්‍යයේ හිස්තැනට සුදුසු පද වැල අයත් පිළිතුර තෝරන්න

1) රන් දෑකැති අරන් දෙන්නා දෙපස　නගේ
2) හේනේ කඩුල්ලට එපිටින් හිටින්　නගේ
3) කුරහන් කපන්නට හේනට වඩින්　නගේ
4) පැලේ තනිව මා ඉඳිතෙයි කියන්　නගේ

39. "සමහරු ශ්‍රේෂ්ඨ ව උපදිති. සමහරු ශ්‍රේෂ්ඨත්වය උදා කර ගනිති. ශ්‍රේෂ්ඨත්වය සමහරුන්ගේ ඇඟේ ගසනු ලැබෙති "
මෙම ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබුවේ,
( 1) තාගොර්තුමා　(2) විලියම් ශේක්ස්පියර්
(3) ජයලත් මනෝරත්න　(4) අකුදගාවා

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

රසවින්දනයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රසවින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වේ. මක් නිසා ද යත් බස ඉතා සුක්ෂ්ම ලෙස පරිහරණය කරන්නේ කවීන් වන බැවිනි.

1) රසවින්දනයට අවැසි බස පිළිබඳ දැනුම වර්ධනය වනුයේ කවියා බස සුක්ෂ්ම ලෙස පරිහරණය කිරීම තුළින් ය.
2) බස පිළිබඳ දැනුම වර්ධනය කිරීමට රසවින්දනය අවශ්‍ය සේ ම, ඊට බස දැන ගැනීම ද අවශ්‍ය වෙයි.
3) කවීන් සුක්ෂ්ම ව පරිහරණය කරනු ලබන බස කාව්‍ය රසවින්දනයටත් බස පිළිබඳ දැනුමත් වර්ධනයත් හේතු වෙයි.
4) බස දැන ගැනීම තුළින් රසවින්දනයට හැකි වෙනා සේ ම කවියා බස සුක්ෂ්ම ව පරිහරණය කරයි.

(ලකුණු - 2 x 40 = 80)